# ක්ෂුද්‍ර මූල්‍ය ණය අර්බුදය හේතුවෙන් බැට කන ලාංකේය ආදිවාසීන්

**2023/11/03**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි අවධානය යොමු කරයි. යහපත් දේශපාලන සංස්කෘතියක් සහ සමාජ වට පිටාවක් ගොඩ නගා ගැනීම සඳහා මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් අප කැපවී සිටිමු.

ලාංකේය ආදිවාසී ප්‍රජාව යනු ස්වාධීන අනන්‍යතාවක් සහිත, සියලු අයිතිවාසිකම් සහ වරප්‍රසාද හිමිවිය යුතු ගෞරවාන්විත පුරවැසි කණ්ඩායමකි. නමුත් අද වනවිට දිවයින පුරා ජීවත්වන ආදිවාසී ප්‍රජාව බොහෝ ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ පා සිටිති. එකී බොහෝ ප්‍රශ්න ගැටලු අතරින් මේ වන විට දැඩි අර්බුදයක් වී තිබෙන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ණය අර්බුදයයි.

ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාදීම සහ එකී ණය ලබාදෙන ආයතන අප කිසිසේත් ප්‍රතික්ෂේප නොකරන අතර එය අඩුආදායම්ලාභී දුගී ප්‍රජාව වෙනුවෙන් වඩාත් සාධනීය අවස්ථාවක් වශයෙන් දකිමු. නමුත් ණය ලබාදීම, ණය අයකර ගැනීම පොලී අනුපාතය ආදී කාරණයන්ගේ සිට නිසි ක්‍රමවේදයක් නොවීම සහ එය ක්‍රියාත්මකවීමේ තිබෙන අවිධිමත් බව, නීති විරෝධී තත්වයන් හා නියාමනය නොකළ ක්‍රම නිසා ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් පුරවැසියන් දිනෙන් දින අර්බුදවලට ලක්වන බැව් පෙනේ. ඒ අතරින් ආදිවාසී ප්‍රජාව ප්‍රමුඛ තැනක් ගනී.

විශේෂයෙන් ම ආදිවාසී ප්‍රජාව යනු සුවිශේෂී භාෂා අන්‍යතාවක් සහිත පුරවැසි කණ්ඩායමකි. ඔවුන් කථනයේදී ‘වැදි භාෂාව’ භාවිත කළ ද ලිඛිත භාෂාව වශයෙන් කටයුතු කරන්නේ සිංහල භාෂාව ය. බොහෝ දෙනෙක්ට සිංහල භාෂා ලිවීමේ හෝ කියැවීමේ සාක්ෂරතාවය නොමැති ය. එසේ ම වාකරේ සහ මුතූර් වෙසෙන මුහුදු ආදිවාසී කණ්ඩායම් භාවිත කරන්නේ ඔවුන්ටම අනන්‍ය දෙමළ භාෂාවකි. ඔවුන්ට සම්මත දෙමළ භාෂාව සම්බන්ධයෙන් සාක්ෂරතාවක් නොමැත.

මෙකී භාෂා ගැටලු හමුවේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ගනුදෙනුවලදී පුරවැසියන් සහ අදාළ ආයතන අතර හුවමාරු කර ගන්නා ගිවිසුම් (Agreement) බොහෝ විට ඇත්තේ ඔවුන්ට නොතේරෙන භාෂාවෙනි. අතළොස්සක් ආයතන මේ වන විට සිංහල සහ දෙමළ භාෂාවෙන් ද අදාළ ලේඛන නිකුත් කරන නමුත් ඒවායේ අන්තර්ගතය ගැන අවබෝධයක් ඉහත කී ආදිවාසී ප්‍රජාවට නොමැතිය. ඔවුන් නිසි අවබෝධයකින් තොරව අදාළ ගිවිසුම්වලට අත්සන් තබන අතර ඉන් පසු නීති ප්‍රකාරවම මේ උගුලේ පැටලේ.

ඌව, නැගෙනහිර, උතුරු මැද යන පළාත් වල විහිදී ජිවත්වන ආදී වාසී ප්‍රජාව බොහෝ ප්‍රමාණයක් ජීවත් වේ. දඹාන, රතුගල, පොල්ලෙබැද්ද, දළුකාන, දිඹුලාගල, වාකරේ, මූතූර් ආදි ප්‍රදේශවල ප්‍රාදේශීය වශයෙන් ජීවත් වෙති. වනාන්තරය ද අහිමිව මහා සමාජයට පිවිස තිබෙන ඔවුන් ආර්ථික, සමාජීය සහ සංස්කෘතික වශයෙන් පීඩාවන් රැසකට මුහුණ පා සිටින මොහොතක මේ ණය උගුලට සිරවීම තව තවත් ඔවුන්ගේ ජීවිත අමාරුවේ දමන තත්වයකි.

මේ වන විට ආදිවාසී නායක ඌරු වරිගේ වන්නිල ඇත්තන් ප්‍රමුඛ ප්‍රාදේශීය නායකයින් තම ප්‍රජාව මුහුණපාන ක්ෂුද්‍ර මූල්‍ය ණය ගැටලුව සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට, මහබැංකුවේ අධිපතිතුමන්ට ලිඛිතව දැනුම් දී තිබෙන අතර ඔවුන්ගේ මූලික ඉල්ලීම වන්නේ තම ප්‍රජාව මුහුණපාන මෙම ණය ගැටලුවට සහන ලබාදීම සහ ණය ලබාදීමේ සහ අය කරගැනීමේ ක්‍රමවේදය විධිමත් කරන හැටියට ය.

අදාළ ලිපි මේ සමඟ අමුණා ඇති අතර ඌරු වරිගේ වන්නිල ඇත්තන් මේ සම්බන්ධයෙන් සිදුකරන ප්‍රකාශනයේ වීඩියෝ පටය ද ඇත. මේ පිළිබඳ ඔබ මාධ්‍ය ආයතනයේ පළ කරමින් මෙරට ආදිවාසී ප්‍රජාව මුහුණපා තිබෙන ක්ෂුද්‍ර ණය අර්බුදය සම්බන්ධයෙන් විසඳුම් ලබා ගැනීම සඳහා සමාජ සංවාදයක් ඇති කිරීමට දායකත්වය ලබා දෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

**සියලු ම ආදිවාසී ප්‍රජාව වෙනුවෙන්,**

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**